# ලංකා බැංකුව

ලංකා බැංකුව යනු ලන්ඩනයේ බැංකු අනුබද්ධිත ආයතනයක් ඇතුළු විදෙස් රටවල් ගණනාවක ක්‍රියාත්මක වන, දිවයින පුරා ශාඛා ජාලයක් ඇති ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුව යි.

ලොව ප්‍රමුඛ පෙළේ බැංකු 1,000 අතරට ශ්‍රේණිගත කර ඇති එකම ශ්‍රී ලාංකික බැංකුව මෙන්ම, ශ්‍රී ලංකාවේ අංක 01 බැංකුව ද වන අප පහත සඳහන් තනතුරෙහි පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සහිත පළපුරුදු පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## පරිපාලක - දත්ත මධ්‍යස්ථාන මෙහෙයුම් (පරිවාස)

### යෝග්‍යතා නිර්ණායක

➢ **ශ්‍රී ලාංකිය පුරවැසියකු විය යුතුය.**

➢ **සුදුසුකම් සහ පළපුරුද්ද**

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් තිබිම.

■ තොරතුරු තාක්ෂණ දත්ත මධ්‍යස්ථාන මෙහෙයුම් පිළිබඳ පළපුරුද්ද (පශ්චාත් උපාධි) අමතර සුදුසුකමක් වේ.

■ ITIL Foundation හෝ MCSA, RHCSA, IBM AS/400 සහතික ලත් පද්ධති පරිපාලක, CCNA වැනි වෙනත් පද්ධති පරිපාලනය පිළිබඳ සුදුසුකම් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

➢ **වෙනත් සුදුසුකම්**

- ස්වයං අභිප්‍රේරිත බව හා තම රාජකාරීන් පිළිබඳ කැපවීම.
- ගැටලු විසඳීමේ විශිෂ්ඨ හැකියාව සමග ඉහළ නවෝත්පාදන කුසලතාව.
- ධනාත්මක චින්තනයෙන් බැංකුවේ අරමුණු ළඟාකර ගැනීමට කැපවීමෙන් යුතුව කටයුතු කිරීම.
- පීඩනයන් යටතේ වුවද ඵලදායී ලෙස කාර්යයන් හි නිරතවීමේ හැකියාව.

➢ **වයස**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 හෝ ඊට අඩු විය යුතුය.

### නියමයන් හා කොන්දේසි

➢ මෙම තනතුර බැංකු සේවයෙහි සාමාන්‍ය නියමයන් හා කොන්දේසි වලට යටත් වන නමුදු සාමාන්‍ය බැංකු ක්ෂේත්‍රයට පරිබාහිර (සංවෘත සේවය) වේ.

➢ අයදුම්කරු සුදුසුයැයි හැඟී ගියහොත් වසරක (01) පරිවාස කාල සීමාවකට පසුව, පරිපාලක – දත්ත මධ්‍යස්ථාන මෙහෙයුම් ලෙස බැංකු සේවයේ ස්ථිර කරනු ලැබේ.

➢ තනතුරට අදළ වැටුප් පරිමාණය:

රු. 90,645/– – රු. 115,045/–

රු. 1,220/– X 20

(විචල්‍ය ජීවන වියදම් දීමනාව ඇතුලු සියලු දීමනා සහිත ආසන්න ආරම්භක දළ වැටුප මසකට රු. 188,000/= පමණ වේ.)

➢ මුර පදනම (Roster Basis) මත හා කාර්යාල වේලාවට අමතරව හා සති අන්තයේ/ නිවාඩු දිනවල සේවයෙහි යෙදීම අපේක්ෂා කෙරේ.

### තෝරා ගැනීමේ පටිපාටිය

➢ යෝග්‍යතා පරීක්ෂණයකින් හා ඉන් පසුව පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගින්.

➢ යෝග්‍යතා පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීම සඳහා පමණක් යොදගනු ලැබේ.

➢ අවසාන තෝරා ගැනීම් සිදු කරනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණු මත පමණක් පදනම්වය.

### අයදුම් කිරීමේ පටිපාටිය

අපගේ වෙබ් අඩවිය වන www.boc.lk ("careers" තීරය) යටතේ බාගත හැකි ආදර්ශ අයදුම්පත භාවිතයෙන් සකසන ලද ඔබගේ ජීවදත්ත පත්‍රිකාව, උප්පැන්න සහතිකයේ, ජාතික හැඳුනුම්පතේ, අදළ සියලුම අධ්‍යාපනික හා වෘත්තීය සහතිකපත්වල සහ ඔබේ පළපුරුද්ද සනාථ කිරීමේ සහතික/ ලේඛනගත සාක්ෂිවල ඡායාස්ථ පිටපත් සමග 2024 නොවැම්බර් මස 16 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති හෝ අදළ සනාථ කිරීමේ ලේඛනවල ඡායාස්ථ පිටපත් නොමැතිව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන හෝ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව එවන ඕනෑම අයදුම්පතක් කිසිදු දැනුම් දීමකින් තොරව බඳවා ගැනීමේ ඕනෑම අදියරකදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන කළමනාකරු (බඳවා ගැනීම් හා වෘත්තීය සංවර්ධන) ලංකා බැංකුව**
**26 වන මහල - ප්‍රධාන කාර්යාලය**
**"ලංකා බැංකු චතුරශ්‍රය "**
**අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.**

■ බැංකුව වෙත කිසිම ආකාරයක බලපෑමක් කිරීම ඔබ මෙම තනතුර සඳහා වහාම නුසුදුසුභාවයට පත්කිරීමට හේතු වේ.

■ තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.

■ සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව හෝ බඳවා ගැනීම කල් දැමීමේ/ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

■ බැංකුවේ පෞද්ගලික දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව, බැංකුව විසින් ඔබේ තොරතුරුවල පෞද්ගලිකභාවය හා රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ.

1975 BOC CALL CENTRE
www.boc.lk
A (lka) Fitch ශ්‍රේණිගත කිරීම AAA Brand Finance ශ්‍රේණිගත කිරීම.
ලංකා බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.
යෝජනා/අදහස්/පැමිණිලි සඳහා - https://www.boc.lk/contact
ප්‍රධාන කාර්යාලය, BOC චතුරස්‍රය,
අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.
ලංකා බැංකුව BOC
ජාතියේ මහා පහන් ටැඹ